# 3 වන දවස

## ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි

දෙවියන් වහන්සේ තම දරුවන්ට යහපත් දේ ම දානය කරන සේක. **"මෙසේ අයහපත් ඔබ ඔබේ දරුවන්ට යහපත් දේ දෙන්නට දන්නහු නම්, ස්වර්ගයේ සිටින ඔබේ පියාණන් වහන්සේ තමන්ගෙන් ඉල්ලන්නන්ට යහපත් දේ ඊටත් වැඩියෙන් නොදෙන සේක්ද?"** (ශු. මතෙව් 7:11). අයහපත් දෙමව්පියෝ පවා තම දරුවන්ට දෙන්නේ හොඳම දේ ය. යහපතේ උල්පත වන දෙවියන් වහන්සේ අපගේ අබ්බා තාත්තා හැටියට අපට ද දෙන්නේ ඉතාමත් යහපත් දේ පමණ ය. අප යහපත් යැයි සිතා ඉල්ලන සෑම දෙයක් ම අපට නොලැබෙයි. අප යහපත් යයි සිතා ඉල්ලන දේ තුළින් අපට සිදුවන්නේ අයහපතක් නම් එය දන්නා අපගේ අබ්බා තාත්තා අපට ඒවා දෙයි ද? එම නිසා ඉල්ලන දේ අපට ලැබුණත් නොලැබුණත් අපගේ දෙව් පියාණන්ට ප්‍රශංසා කරමු. ස්තූති කරමු.

**දවස පුරා :-**

- ✵ අද දවස පුරා අබ්බා තාත්තාට අපට දෙන ලද සෑම දෙයක් උදෙසා ම ප්‍රශංසා කරමු. එලෙස ම අප ඉල්ලුවත් නොලැබූ අවස්ථා මුල් කරගෙන ද ස්තූති ප්‍රශංසා කරමු.
- ✵ පුබුදු ගීතාංජලී ගී අංක 234